සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Provincial Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 15 S

ක්‍රිස්තියානි ධර්මය | කාලය පැය දෙකයි

නම ..............................................

උපදෙස් : සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

## I - කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

01. ඊශ්‍රායෙලයේ ප්‍රථම රජ ලෙස සැලකෙන්නේ,
    01. දාවිත් ය 02. සාමුවෙල් ය 03. සලමොන් ය 04. හෙරොද් ය

02. නෝවා දෙවිඳුන් ඉදිරියේ,
    01. ප්‍රේමයෙන් ජීවත් විය. 02. ධර්මිෂ්ඨව ජීවත් විය.
    03. බෙදාහදා ගෙන ජීවත් විය. 04. ප්‍රීතියෙන් ජීවත් විය.

03. මෙපිබෝෂෙත්ව ආදරයෙන් රැකබලා ගත්තේ,
    01. දාවිත් ය 02. සාවුල් ය 03. සලමොන්ය 04. නාතාන් ය

04. දේව මැවිල්ල ගැන ශු.බයිබලයේ සඳහන් වන්නේ,
    01. ගීතවලිය පොතේ ය 02. නික්මයාම පොතේ ය
    03. උත්පත්ති පොතේ ය 04. ජෝබ් පොතේ ය

05. දේව මැවිල්ලේ උසස්ම නිර්මාණය වන්නේ,
    01. ගස්වැල්ය 02. ඉර හා සඳ ය 03. දවාල හා රාත්‍රිය වේ 04. මිනිසාය

06. දේව මැවිල්ලේ භාරකරු වන්නේ,
    01. දෙවියන් වහන්සේ ය 02. ජේසුන් වහන්සේ ය
    03. මිනිසා ය 04. සියලු ලෝක සත්වයන් ය

07. ශුද්ධ බයිබලයේ මුළු පොත් ගණන වන්නේ,
    01. 27 යි 02. 39 යි 03. 66 යි 04.70 යි

08. මහ සිකුරාදා දිනයේ දී අප සමරන්නේ,
    01. ජේසුන් වහන්සේගේ උපත යි 02. ජේසුන් වහන්සේගේ මරණය යි
    03. ජේසුන් වහන්සේගේ උත්ථානය යි 04. ජේසුන් වහන්සේගේ බෞතීෂ්මය යි

09. දාවිත්ගේ මිත්‍රයා වූයේ,
    01. ජොනාතන් ය 02. ජොහන් ය 03. රෙහෙබෝවම් ය 04. මෙපිබොෂෙත් ය

10. කිතුනු දිවියේ වැදගත් සන්නිවේදන මාධ්‍ය වන්නේ,
    01. දේව වචනය යි 02. ජේසුස් වහන්සේ ය
    03. යාච්ඤාව යි 04. දෙවියන් වහන්සේ ය

11. ''ස්වාමීන් වහන්සේ මාගේ එඬේරාණෝය අඟහිඟ මට නොවන්නේ ය'' මෙම පාඨයෙන් පැහැදිළි වන්නේ,
    01. දෙවිඳුන් දිව්‍ය පෝෂකයාණෝ බව ය 02. දෙවිඳුන් ගැලවුම්කරුවාණෝ බව ය
    03. දෙවිඳුන් රැකවරයාණෝ බවය 04. දෙවිඳුන් සර්වබලධාරියාණෝ බව ය

12. සබත් දිනයේ සුවකළ රෝගියෙකු වන්නේ,

01. අංශභාග රෝගියා ය　　02. අතක් පණ නැති මිනිසා ය

03. ලාදුරු රෝගියා ය　　03. බිහිරි මිනිසා ය

13. එළියා දිවැසිවරයා පෝෂණය ලැබුවේ,

01. සමාරි ස්ත්‍රිය මඟින් ය　　02. නියාන් නුවර වැන්දඹුව මඟින් ය

03. ශාරපෙත්හි වැන්දඹුව මඟින් ය　　04. නයෝමි මඟින් ය

14. රාජ්‍ය නිළධාරියාගේ පුතා රෝගාතුරව සිටියේ,

01. බෙතානියේ ය　　02. නාසරෙත් නුවර ය

03. කපර්ණවුමේ ය　　04. බෙත්සයිදා නුවර ය

15. ජේසුතුමා වෙතින් සුවය බලාපොරොත්තු වූ රාජණ නිළධාරියා තුළ වූ විශේෂ ගුණාංග වන්නේ,

01. ඇදහිල්ල හා කීකරුකම යි　　02. ඇදහිල්ල හා බලාපොරොත්තුව ය

03. ඇදහිල්ල හා විශ්වාසය යි　　04. ඇදහිල්ල හා යටහත්පහත්කම යි

16. ස්වාමින් වහන්සේගේ යාච්ඤාව,

01. පරාර්ථකාමි යාච්ඤාව කි　　02. ආත්මාර්ථකාමි යාච්ඤාව කි

03. පව් කමා කිරීමේ යාච්ඤාව කි　　04. ස්තුතිදීමේ යාච්ඤාව කි

17. ශු. බයිබලයේ අඛණ්ඩව දිවෙන තේමාව වන්නේ,

01. මැවිල්ල ය　　02. ඇදහිල්ල ය　　03. ප්‍රේමය ය　　04. ජේසු උපත ය

18. දොස් සහිත සමාජයක නිදොන්ව ජීවත් වීමේ අභියෝගය අපට ලබා දුන්නේ,

01. මොතෙන් ය　　02. නෝවා ය　　03. ආබ්‍රහම් ය　　04. සිමියොන් ය

19. ජුදෙව් ජන සමාජය තුළ දේව වචනය හැදෑරීමට එක්රැස් වූයේ,

01. දේව මාලිගාවට ය　　02. කඳුමුදුන් වලට ය

03. ධර්ම ශාලාවට ය　　04. සැන්හෙන්ඩ්‍රියන් සභාවට ය

20. නව යොවුන් වියේ සිටින ඔබ, සැමවිට

01. ඔබ කැමති දේ කළ යුතු ය　　02. දේමාපියන් කැමති දේ කළ යුතු ය

03. සමාජය කැමති දේ කළ යුතු ය　　04. දෙවිදුන්ගේ කැමැත්තට ක්‍රියා කළ යුතු ය

(2x2=40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න

(01)කෙටි පිළිතුරු සපයන්න

01. ශු.බයිබලයේ සත්ගුණවත් මිනිසා ලෙස හඳුන්වන්නේ කවුද?
02. ස්වාමීන් වහන්සේගේ යාච්ඤාව කියන අවස්ථා 02 ක් නම් කරන්න.
03. දාවිත්ට සාවුල්ව මුණ ගැසුණු ගුහාව කුමක්ද?
04. ජේසුන් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 02ක් ලියන්න.
05. ''අබ්බා'' යන අරමීය යෙදුමෙහි අර්ථය කුමක්ද?
06. ජේසුන් වහන්සේගේ ප්‍රථම ප්‍රාතිහාරය නම් කරන්න.
07. හාරදහසකට කෑම දීමේ සිද්ධිය තුළ ජනතාව දේව වචනයට සවන් දෙමින් සිටි කාලය කොපමණද?
08. නෝවාට සිටි දරුවන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(2x8=16)

(02) 01. නෝවා තුළ තිබූ යහපත් ගුණාංග 02ක් නම් කරන්න.
02. නෝවා තුළ තිබූ යහපත්කම නිසා දෙවිඳුන් ඔහුට දුන් ආශිර්වාදය කුමක්ද? (03)
03. දෙවියන් වහන්සේ ඉදිරියේ ධර්මිෂ්ඨව ජීවත් වීමට ඔබට කළ හැකි දේවල් 03ක් ලියන්න

(2+3+6=11)

(03) 01. දාවිත් රජුගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා 02ක් ලියන්න.
02. දාවිත් රජුගෙන් ඔබේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ 03ක් ලියන්න
03. ඔබේ පංතිකාමරයේ විශේෂ අවශ්‍යතා ඇති මිතුරෙකුට ඔබට කළ හැකි උපකාර 03ක් ලියන්න.

(2+3+6=11)

(04) 01. ජේසුන් වහන්සේ ජීවත් වූ සමාජයේ ජනයා යාච්ඤා කිරීමේදී අනුගමනය කළ වැරදි පිළිවෙත් 02ක් ලියන්න.
02. ස්වාමීන් වහන්සේගේ යාච්ඤාවේ අඩංගු කරුණු 03ක් ලියා දක්වන්න.
03. අප යාච්ඤා කරන විට සිටිය යුතු ආකාර 03ක් ලියන්න.

(2+3+6=11)

(05) 01. ශුභාරංචි පොත් අතුරින් කානා නුවර පිළිබඳ සඳහන් කරන සුභාරංචි පොත නම් කරන්න.
02. කානාහි සරණ මංගල්‍ය තුළ සිදු වූ සිදුවීම් කෙටියෙන් ලියන්න.
03. ඔබේ දේවස්ථාන පළාත තුළ ආර්ථික අපහසුතා සහිත පවුලක් වෙනුවෙන් කළ හැකි උදව් 03ක් ලියන්න.

(2+3+6=11)

(06) 01. පැරණි ගිවිසුමේ දෙව බලය තුළ පෝෂණය ලැබූ එක් අවස්ථාවක් ලියන්න.
02. හාරදහසකට කෑම දීමේ ප්‍රාතිහාර්ය තුළ ශ්‍රාවකයන් අත තිබූ රොටී හා මසුන් ගණන කීයද?
03. ඔබ දෙවියන් වහන්සේගේ බලය අත්දුටු අවස්ථාවක් කෙටියෙන් ලියන්න.

(2+3+6=11)

**8 ශ්‍රේණිය** පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 2 | 06. 3 | 11. 1 | 16. 1 |
| 02. 2 | 07. 3 | 12. 2 | 17. 3 |
| 03. 3 | 08. 2 | 13. 3 | 18. 2 |
| 04. 3 | 09. 1 | 14. 3 | 19. 3 |
| 05. 4 | 10. 3 | 15. 4 | 20. 4 |

(2x2=40)

II කොටස

(1)
01. නෝවා
02. ඉරිදා දේවස්ථානයේ, පවුලේ යාච්ඤාවේ, පවුලේ උදෑසන ආගම සිහිකිරීමේදී ආදි පිළිතුරු දෙකක්
03. එන්ගෙදිගේ ගුහාව
04. ගෙත්සමෙනේ උයනේදී ශ්‍රාවකයන් සොයා ගැනීමට පෙර
05. පියාණෙනි
06. වතුර මිදි යුෂ කිරීම
07. දින 03ක්
08 ෂෙම්, හාම්, ජපේත් යන නම් වලින් දෙකක් 2x8=16

(2)
01. කීකරුකම, නිහතමානීකම, දෙවිදුන් කෙරෙහි විශ්වාසය
02. තම බිරිඳ දරුවන් හා නැවේ සිටි සියලුම වර්ගයේ සතුන් ජල ගැල්මෙන් බේරා ගැනීම.
03. වැඩිහිටියන්ට කීකරු වීම, යහපත පමණක් තෝරා ගැනීම, ඇත්ත කථා කිරීම, දේව හඬට ඇහුම්කම් දීම

(2+3+6=11)

(3)
01. මෙපිබෝෂෙත්ට කරුණාව දැක්වීම.
එන්ගෙදියේදී සාවුල්ව මුදා හැරීම.
02. පළිගැනීම වෙනුවට ප්‍රේමයෙන් ක්‍රියාකිරීම.
දේව භය ඇතිව ක්‍රියා කිරීම.
දහැමි ජීවිතයක් ගත කිරීම. (පෙළ පොතේ 7 පිටුව)
03. ලියා ඇති පිළිතුරු අනුව කරුණු 03ක් ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(2+3+6=11)

(4)
01. මංමාවත් වල හිටගෙන යාච්ඤා කිරීම.
නිරර්ථක වූ වචන කියමින් යාච්ඤා කිරීම.
02. ස්වාමින් වහන්සේගේ යාච්ඤාවේ අඩංගු කරුණු 03ක් සඳහන් කිරීම.
03. දෑස් පියා ගැනීම.
දෑත් එක්ව තබා ගැනීම.
දණ නැමීම ආදී (පෙළ පොත 13 පිටුව)

(2+3+6=11)

(5)
01. ශු.ජෙහාන් සුභාරංචිය
02. සිදුවීම කොටියෙන් ලිවීම ප්‍රමාණවත් වේ.
03. සිසුන් ලියා ඇති කරුණු සළකා බලා ලකුණු ලබා දෙන්න.

(2+3+6=11)

(6)
01. පාළුකරයේදී ඊශ්‍රායෙල් ජනතාව පෝෂණය කිරීම.
එළියා දිවැසිවරයා ශාරපෙත්හි වැන්දඹුව මඟින් හා කපුටන් මඟින් පෝෂණය ලැබීම.
02. රොටී - 07 මාළු ස්වල්පයකි
03. ශිෂ්‍ය පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න.

(2+3+6=11)